# අනුරාධපුර අභයගිරිය හා ජේතවන ආරාම සංකීර්ණ ආශ්‍රිතව හඳුනාගත හැකි උරුම කළමනාකරණ ගැටළු

කේ.එන්. කරුණාතිලක

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
kalpaninirukshika8@gmail.com

## හැඳින්වීම

ශ්‍රීලංකාවේ ඉපැරණි අගනුවර වූ අනුරාධපුරයෙහි දෙවැනි මහාවිහාරය වූ අභයගිරි විහාර සංකීර්ණය අක්කර 500ක් විශාල භූමිභාගයක් තුළ පැතිර පවතින සංඝාරාම සංකීර්ණ 27කින් ද වෙනත් ආගමික ගොඩනැගිලිවලින් ද යුක්ත අභයගිරි පරිශ්‍රය විවිධ රජවරුන් විසින් වරින් වර ප්‍රතිසංස්කරණය කරන ලද අතර ඔවුනොවුන් විසින් නවාංග රාශියක් ද එකතු කර ඇත. ඒ අතර ආගමික ගොඩනැගිලි, පිළිම, පොකුණු යනාදිය වේ. මෙම පර්යේෂණයේ දෙවැනි ප්‍රවේශය වූ අනුරාධපුර ජේතවන පරිශ්‍රය පිළිබඳ තොරතුරු ක්‍රි.ව. තෙවැනි සියවසේ සිට වාර්තාගතවී තිබේ. ජේතවනාරාම විහාරයේ භූමි වපසරිය අක්කර 200ක් පමණ වන අතර ස්තූප පරිශ්‍රය පමණක් අක්කර 9 ක් වෙන් වී තිබේ. ජේතවනාරාම සංඝාරාම සංකීර්ණයේ පැරණි වැදගත් ස්මාරක අතර, පිළිමගේ, බෝධිඝරය, උපෝසතඝරය, දානශාලාව, වට පොකුණ ආදිය ද වේ. මෙම ආරාම සංකීර්ණයන්හි පවත්නා සංස්කෘතික උරුමය නිසා අභයගිරිය හා ජේතවනාරාමය ජගත් උරුමයන් ලෙස සැලකේ. උරුමය යනු ඕනෑම රටක ස්වකීය අනන්‍යතාවය ඉස්මතු කරනු ලබන ප්‍රධාන සාධකයක් සේම අතීත මානව වර්ගයාගේ පැවැත්ම හා ක්‍රියාකාරකම් පිළිබඳව කියැවෙන මූලික වාර්තාවක් ද වේ. ජාතික හා ජාත්‍යන්තර ප්‍රජාවගේ අවධානයට ලක් වන අභයගිරිය හා ජේතවන ආරාම සංකීර්ණ ආශ්‍රිතව හඳුනාගත හැකි උරුම කළමණාකරන ගැටළු මොනවාද? යන්න අධ්‍යයනය කිරීම මෙහි දී බලාපොරොත්තු වේ.

## ක්‍රමවේදය

දත්ත රැස් කිරීමේ දී ප්‍රධාන වශයෙන් ක්‍රමවේදයන් දෙකක් අනුගමනය කරන ලදී. එනම්, ක්ෂේත්‍ර අධ්‍යයනය හා ක්ෂේත්‍ර නොවන අධ්‍යයනයයි. ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී අභයගිරිය හා ජේතවන ආරාම සංකීර්ණවල උද්ගතව ඇති උරුම කළමනාකරණ ගැටළු කොටස් වශයෙන් ගෙන අධ්‍යයනය කිරීම.

1. මානව ක්‍රියාකාරකම්
2. භෞතික හායනයන්
3. ජීව විද්‍යාත්මක ක්‍රියාකාරකම්

ක්ෂේත්‍ර නොවන අධ්‍යයනයේ දී පුස්තකාල පරිශීලනය සාහිත්‍යය මූලාශ්‍ර පරිශීලනයෙන් පසු සමාජ විද්‍යා අධ්‍යයනවල දත්ත රැස් කිරීම සඳහා භාවිත කරනු ලබන ගුණාත්මක හා සංඛ්‍යාත්මක දත්ත රැස් කිරීමේ විධික්‍රම භාවිත කළ අතර එහි දී, නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා, කේවල අධ්‍යයන ආදී ක්‍රමවේද භාවිත කරන ලදී .

## ප්‍රතිඵල හා සාකච්ඡාව

අභයගිරිය හා ජේතවන ආරාම සංකීර්ණ ආශ්‍රිතව හඳුනාගත හැකි උරුම කළමනාකරණ ගැටළු අධ්‍යයනයේ පහසුව සඳහා මානව ක්‍රියාකාරකම්, භෞතික හේතුකාරනා, ජීව විද්‍යාත්මක හේතු ආදී කොටස් වශයෙන් ගෙන අධ්‍යයනය කරන

ලදි. අභයගිරිය හා ජේතවන ආරාම සංකීර්ණ ආශ්‍රිත හඳුනාගත හැකි උරුම කළමනාකරණ ගැටළු අතරින් මානව ක්‍රියාකාරකම් ලෙස භික්ෂූන්වහන්සේලා, පුරාවිද්‍යා නිළධාරීන්, ආරක්ෂක අංශය, හිඟන්නන් ආදි වූ සමාජයේ විවිධ පිරිස් භාවිත කරන්නන් අතර වෙයි. මෙම ජනතාවගේ විවිධ ක්‍රියාකාරකම් හේතුවෙන් මෙම ආරාම සංකීර්ණවලට ප්‍රබල උරුම අභියෝගයන්ට ලක් වී ඇත. නරඹන්නා කළමනාකරණය නොකිරීම, උරුම ස්ථාන නඩත්තු නොකිරීම (බැමි මත නිදා ගැනීම, අපද්‍රව්‍ය ස්මාරකය අසළ බැහැර කිරීම), මාර්ගෝපදේශනයේ දූර්වලතා, මානව සම්පත්වල හිඟය, දේශපාලන බලය නිසා සිදු වන අවිධිමත් සංවර්ධන ගැටළු ආදිය පෙන්වාදිය හැකි ය.

භෞතික විද්‍යාත්මක ක්‍රියාකාරකම් ලෙස සංඥා පුවරු හා දැන්වීම් පුවරු නොමැතිවීම, යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම, දේශීය හා විදේශීය සංචාරකයන්ට සෑම භාෂාවකින්ම අත්පත්‍රිකා ලබා නොදීම, පාදම ශක්තිමත්ව නොයෙදීම නිසා ඉහළින් එන පීඩනය නිසා ස්මාරක ඇලවීම වක්‍රවීම හා ගිලා බැසීම් සිදු වීම, ස්මාරක පාදම යටින් ශාක මුල් යාම නිසා බිත්තියේ පැලීම් සිදු වීම, බාගෙට පිළිස්සූ ගල් හා නොපිළිස්සූ ගල් භාවිතය, මෘදු ගඩොල් මත දැඩි බදාම භාවිතය ආදිය දැකගත හැකිය. ජීවවිද්‍යාත්මක ක්‍රියාකාරකම් ලෙස ස්මාරකවල කොටස් තෙතමනය සහිත කාලවල දී ඇලිගි සහ ලයිකන වර්ධනය සිදු වන අතර වියළි කාලයේ දී මෙහි ස්මාරකයේ කොටස් ගැලවී යාම, සතුන්ගේ මළ මුත්‍ර ස්මාරක මතට හෙළීම, දැඩි හිරු රශ්මියෙන් ස්මාරකවලට සිදු වන හානි පෙන්වාදිය හැකි ය. වර්තමානයේ අභයගිරිය හා ජේතවන ආරාම සංකීර්ණ ආශ්‍රිත උද්ගතව ඇති ප්‍රධාන උරුම කළමනාකරණ ගැටළු ලෙස ඉහත දක්වූ කරුණු පෙන්වාදිය හැකි ය. මෙම ගැටළු හේතුවෙන් වර්තමානයේ මෙම ආරාම සංකීර්ණවල උරුමයන් දිනෙන් දින විනාශයට පත් වෙමින් පවතින බව අවබෝධ විය. උරුමයන්ට සිදුවන මෙම හානිය වළක්වමින් මෙම ගැටළු නිසි ආකාරව පාලනය කිරීම සඳහා නව උරුම කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක කළ යුතු බව පෙන්වාදිය හැකි අතර ප්‍රෞඪ ඉතිහාසයක තොරතුරු හෙළි වන මෙම ස්ථානවල උරුමයන් නිසි අයුරින් කළමනාකරණය කිරීමේ ඇති වැදගත් කම පිළිබඳ ව දැනුවත් ව එය විනාශ මුඛයෙන් ගලවා ගැනීම වර්තමාන වගකිව යුත්තන්ගේ යුතුකමක් ව පවතින බවට පෙන්වාදිය හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ


කුලතුංග ටී.ජී. (2004)***අභයගිරිය පරියේෂණ.*** කොළඹ 08: මධ්‍යම සංස්කෘතික අරමුදල.

ලගමුව, ආරිය. (2015)***අටමහා සිද්ධස්ථාන සහිත සොළොස්මහා සිද්ධස්ථාන.***අනුරුගිරියඃ අමිල ප්‍රින්ටර්ස්.

කුලතුංග ටී.ජී, (2004)***අනුරාධපුර අභයගිරි විහාරය.*** තරංග ප්‍රින්ටර්ස්.

මැන්දිස්, තුසිත., ගුණරත්න, ශ්‍යාමලි. (2016)***උරුම කළමනාකරණ ප්‍රවේශය.*** පේරාදෙණියඃ නෙත්වින් ප්‍රින්ටස්.